**Australian Advocacy for Good Governance in Sri Lanka Inc.**
**ශ්‍රී ලංකාවේ යහපාලනය සඳහා වූ ඔස්ට්‍රේලියානු සහයෝගිතාව**
**இலங்கையில் நல்லாட்சிக்கான அவுஸ்திரேலிய அனுசரணை (இணை)**
**Reg. No. A0062162S**

## අගමැතිවරයා ඉවත් කිරීම ව්‍යවස්ථා විරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ජනතා කැමැත්ත යටපත් කරන පියවරක්

ශ්‍රී ලංකාවේ යහපාලනය සඳහා වූ ඔස්ට්‍රේලියානු සහයෝගිතාව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් 2018 ඔක්තෝබර් 26 වනදා රාත්‍රියේ ධූරයේ සිටින අගමැතිවරයා අනපේක්ෂිත ලෙස ඉවත් කිරීම දැඩි ලෙස හෙළා දකියි. ජනාධිපතිවරයාගේ මෙම වගකීම් විරහිත, අසාධාරණ ක්‍රියාව නීති විරෝධී ය. ව්‍යවස්ථා විරෝධී ය. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට කරන ලද බරපතල හානියකි. මෙය අපගේ බරපතල, බැරෑරුම් තීරණය වේ.

2015 අප්‍රේල් මාසයේ අතිමහත් බහුතරයක අනුමැතියෙන් සම්මත කර ගත් දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අගමැතිවරයා ජනාධිපතිවරයාට නොව පාර්ලිමේන්තුවට වගකිව යුතු බවට සහතික කරයි. අගමැතිවරයා ඉවත් කරන්නට ජනාධිපතිවරයා සතුව තිබුනු බලය නිෂ්ප්‍රභ කරයි. ඒ අනුව, ජනාධිපතිවරයාට අගමැතිවරයාගේ ධූර කාලයට මැදිහත් විය නොහැකි අතර, ආණ්ඩුව අස්ථාවර කිරීමට ජනාධිපතිවරයාට ඇති හැකියාව ව්‍යවස්ථානුකූල ලෙස මැඩ පවත්වා ඇත.

තවද විශ්වාසභංග යෝජනාවක් මඟින් පාර්ලිමේන්තුවේ ස්ථාවරය පරීක්ෂාවට ලක් නොකළ හොත්, ධූරයේ සිටින අගමැතිවරයා ගැන පාර්ලිමේන්තුවට විශ්වාසය පවතින්නේ ද යන්න මැන ගන්නට ජනාධිපතිවරයාට නොහැකි ය. ධූරයේ සිටින අගමැති හා කැබිනට් මණ්ඩලයට ජනාධිපතිවරයා තමන් ගත් පියවර ගැන කිසිදු පූර්ව දැනුම්දීමක් නොකිරීමෙන් ඇඟවෙන්නේ කවර ආකාරයකින් හෝ අගමැතිවරයා බලයෙන් නෙරපීමේ කුමන්ත්‍රණයක් පැවති බවට ඉඟියකි.

ජනාධිපතිවරයා  තමන්ගේ දේශපාලන වාසිය තකා මනා ප්‍රජාතන්ත්‍රීය පැවතුම්  මෙසේ නිර්ලැජ්ජිත ලෙස නොතකා හැරීමත්, යහපාලන මූලධර්මවලට පිටුපෑමත් නිසා රට ව්‍යාකූලත්වයට හා අස්ථාවරභාවයට පත් වෙමින් තිබෙන බව ශ්‍රී ලංකාවේ  යහපාලනය සඳහා වූ ඔස්ට්‍රේලියානු සහයෝගිතාවයේ වැටහීමයි. නීති විරෝධී ලෙස දිවුරුම් දුන් අගමැතිවරයාගේ හිතවතුන් විසින් රජයට අයත් ලේක්හවුස් සහ ජාතික රූපවාහිනිය ඇතුළු මාධ්‍ය ආයතනවලට එල්ල කැරෙන පීඩා කිරීම් සහ තර්ජන පිළිබඳ වාර්තාවලින් ඇඟවෙන්නේ නීතියේ ආධිපත්‍යය, ප්‍රකාශනයේ නිදහස සහ සාමය කෙරෙහි සැලකිය යුතු අභියෝගයක් එල්ල කරමින් සිටින බවයි.

අප ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ පාර්ලිමේන්තුව වහාම කැඳවා, ඔහුගේ අදූරදර්ශී ක්‍රියාවන් හේතු කොටගෙන ඇති වූ මෙම අර්බුදය කඩිනමින්, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස හා ව්‍යවස්ථානුකූල ව විසඳන ලෙසයි. පාර්ලිමේන්තුව කල් දැමීම ඇතුළු වෙනත් යම් යම් ප්‍රයත්නවලින් සිදු කරන්නේ ජනතා කැමැත්ත යටපත් කිරීම පමණකි. දශක ගණනාවක් ජාත්‍යන්තරව හුදෙකලා වී සිට එම තත්වයෙන් ගොඩ ඒමට පටන් ගෙන ඇති රටේ ගැටළු දූෂිත, ඒකාධිකාරී දේශපාලනඥයින් තමන්ගේ පෞද්ගලික පරමාර්ථ ඉටුකර ගැනීමට දේශපාලන සටකපටකම් යොදා ගැනීම හේතුවෙන් තවත් වැඩි කර ලනවා ඇත.

මෙම තීරණාත්මක අවස්ථවේදී, ශ්‍රී ලාංකීය ජනතාවගේ කෝපය සාධාරණය. 2015 ජනවාරි 8 වැනි බ්‍රහස්පතින්දා තමන්ගේ මිලකළ නොහැකි ඡන්දය ලබා ගැනීම සඳහා දුන් පොරොන්දු ඉටු කරන ලෙස ඉල්ලා නීතියේ සීමාව තුල කෙරෙන සියලු බලපෑම් ඔවුන් සතු අයිතිය භාවිතා කිරීමකි. නිර්ලජ්ජිත ලෙස සමාව නොඉල්ලන දේශපාලන ගජ මිතුරන් විසින් උඩඟු ලෙස බලය අත්පත් කර ගැනීම ජනතාව සැහැල්ලු ලෙස නොසලකනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, සාමය හා සංවර්ධනය, සංහිඳියාව සහ ජාත්‍යන්තර කීර්තිය නොනැසී පවත්වා ගෙන යෑම අවදානමට ලක් වී ඇත. මෙම බරපතල තර්ජනයට එරෙහිව සාමූහික ලෙස නැඟී සිටින ලෙස අපි ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් සහ සිවිල් සමාජ සංවිධානවලින්  ඉල්ලා සිටිමු.

අත්සන් කලේ:

ආචාර්ය ලයනල් බෝපගේ
සභාපති
ශ්‍රී ලංකාවේ යහපාලනය සඳහා වූ ඔස්ට්‍රේලියානු සහයෝගිතාව
ඊමේල්: lionel.bopage@gmail.com

**කැඳවුම් කරුවෝ:**
විමල් ජයකොඩි, විරාජ් දිසානායක, සිති මරික්කාර්, සිරිල් ගුණරත්න, සිරාජ් පෙරේරා, ෂ්‍යාමොන් ජයසිංහ, සරත් ජයසූරිය, සාලිය ගලප්පත්ති, රංජිත් වීරසිංහ, ප්‍රසාද් මොහොට්ටි, නල්ලයියා සූරියකුමරන්, ලයනල් බෝපගේ, ලැරී මාෂල්, ලාල් පෙරේරා, ජූඩ් පෙරේරා, චිත්‍රා බෝපගේ, අතුල පතිනායක , අශෝක අතුරලිය, ආරි පිටිපන, අනුර මංචනායක, ඇන්තනි ශ්‍රේෂන්, අජිත් රාජපක්ෂ